ලිංගික අපරාධයන් තවමත් ශ්‍රී ලංකාවේ නීති ග්‍රන්ථ තුළ සඳහන් වන්නේ දූෂණය යන වචනයෙනි. කෙසේ නමුත් දූෂණය නැතිනම් කෙලෙසීම වැනි යෙදුම් ඔස්සේ වින්දිතයෙකු අපවිත්‍ර වී ඇති බවක් ගම්‍ය වන අතරම, දූෂණය/කෙලෙසීම වැනි යෙදුම් සමගින් බැඳි සමාජ ගර්හාවක්ද තවමත් සමාජයේ පවතී. ඒ ඔස්සේ සිදුවන්නේ ලිංගික අපරාධයක වින්දිතයෙකු නැවතත් සමාජයෙන් කොන් කිරීමකට ලක් වීමයි. මේ හේතුව නිසා, මෙවැනි සිදුවීම් මාධ්‍ය විසින් වාර්තා කිරීමේදී භාවිතා කළ යුතු වඩාත් යෝග්‍ය යෙදුම් වන්නේ 'ලිංගික අපරාධය' හෝ 'ලිංගික අපයෝජනය' නොවේද? ඒ පිළිබඳ ඔබේ අදහස කුමක්ද?

#MediaEthicsSL #lka #SinhalaPress #Mawbima #SundayMawbima #Divaina